# නිර්මාණ Nirmana

## ජේසු සමිඳුනි !

කිතු දෙව් සමිඳ සාමයෙ පණිවුඩය ගෙන
ඔබ ලොව පහල වුණු බව අපි සිටිමු දැන
බලකාමයෙන් තණ්හාවෙන් වියරු දන
සාමය අළු කරන අන්දම බලනු මැන

දහමෙන් ගෙවන දිවි කඩමලු පැදුරේ ය
අදමිටු එවුන් හට සුර සුව නුදුරේ ය
දුක්විඳ හැදූ පුතා සක්විති මැදුරේ ය
මව්පිය දෙදෙන අම්බලමේ අඳුරේ ය

දස්කම් සුදුසුකම් කිසිවක් නැත සතුව
පන්දම්කාරයෝ වැජඹෙති බල ගතුව
ඉහටත් උඩින් සරසවි සහතික ඇතුව
දක්සයෝ සිටිති අද යන එන මං නැතුව

ජන සංනිවේදකයින් පිට කොඳුව ඇතී
ලොකු ලොක්කන්ගෙ හෙළිකළ විට විෂම ගතී
උන් රැක සිටින ඇම්බැට්ටයෝ මොළය නැතී
කුලු මීමන් වගේ ඇන ඇන පහර දෙතී

රට ජාතිය නැගුමට යයි බලය ගෙන
ජේසුනි ඔවුන්ගෙන් ඇතැමු නොමග පැන
නොතකා කරන නොපණත්කම් වැරදි ගැන
උන්හට ලැබේ පුද සැලකිලි ඉහළ තැන

දූෂණ වංචාව ගැන අද නිතර ඇසේ
පාතාලයන් කෙරුමන් රජකරනු දිසේ
හව්හරණයක් නැති අසරණ පිරිස නැසේ
අදමිටු ලොවක ජීවත්විය හැකිද කෙසේ

♦ **කව්ඩාණේ පියදාස පෙරේරා**
Sri Lanka

## වියෝගය

නොවැටී ඇවිදින්න හිස ඔසවා ඉන්න
නම රැකගන්න හොඳ ගතිගුණ රැක ගන්න
කරුණා දයා මෙත හද තුළ පුර වන්න
අම්මේ ඔබයි මට ඒ ඔවදන් දුන්න

ඔබගේ ආදරය කරුණා සා ගරය
සෙනෙහස පැව සම කළ හොත් මහ මෙරය
අද සැනසෙන්නෙ මා ඒවා සිහි කරය
ලෝ දම ඔබ අපෙන් වෙන්කර අහ වරය

දරු මුනුපුරන් නෑදෑ හිතවතුන් එන
පෙර මග බලා සිටියා ආදරෙන් මන
පාළුයි ගෙදර අම්මා මිය ගියා ඉන
නැහැ කවුරුත් ගෙදර සැනසුම ලබා දෙන

මියගිය දිනේ සිට අවුරුද්දක් ගානේ
දරුවන් රැන අම්මට පින් පිරු වානේ
අම්මා සිටියදිත් පින්දම් කෙරු වානේ
අපි මුණ ගැසෙමු දොරටුවෙ දී නිරු වානේ

♦ **ප්‍රේමා එස්. රූපසිංහ**
නුගේගොඩ Sri Lanka

## මෙත් පුරමු !

එක එකා මිය යද්දි ඇසුරු කළ මිතුරි යන්
හදවතේ හදගැස්ම හිතට වදයක් වෙමින්
පවසද්දි නිසරු බව ජීවිතයෙ අරුත් සුන්
මම කෙසේ වැවෙම්ද හදවතේ සැනසු මෙන්

ඇන කොටා බැණ වදින ජීවයට දැඩි ලොවින්
ගැවසෙනා වටපිටේ කටුක බව පෙන් වමින්
හැර යන්න හැකි වුවත් වෙනින් තැනකට සෙමින්
ඉඩ නොදෙයි ලෝබ සිත පැනයන්න මේ ලොවින්

සන්තෝස උපදන්න සිත් සතන් පහන් කර
මෙත් සිතින් අසල්වැසි සතුට නිති උදා කර
තබන්නට දිරිගන්න කරුණාව වගා කර
පින් බලෙන් මෙත් වැඩේ හදවතම පහන් කර

ගෙවන දිවි සරුවෙන්න දැඩි බරක් ඇති නො වී
වැඩෙන මෙත් සෑහේවි බැති බරින් මුදිත වී
හදවතෙහි කුරිරුකම මැඩගන්න වෙහෙස වී
යන ලොවට පිය නගමු මෙත් සිතින් උදිත වී

♦ **මධුරි අබේවික්‍රම** Harrow UK

### ලෝකෝපකාරයෙන්

රදුන් ලොබැති දෙයට -
ලොබය නොකරව් පණට හිතැතොත්
පලහැටිගොදුරු පත් -
වැටුප් මැද වැද නැසුණු ලෙස වේ

පණ ආරක්ෂා කරගන්නට කල්පනා කරන්නේ නම් රජවරුන් ආසාකරන දෙයට ආසා නොකරව්. නැතහොත් ගොදුරු පතා එන පළහැටියා පහන මැදට වැටී විනාශ වූවාක් මෙන් විනාශ වන්නේය.



## නත්තල දිලේවා !

හැම පැල්පත් මුදුනෙ රන්තරු දිලී යන්
කිතුහිමි සමගමය නත්තල දැනී යන්
හොඳ හිත මගින් සාමයෙ සෙත සැදී යන්
හැම හිස මතම නත්තල් මල් පිපී යන් !

ගවහල සරසවියෙ ඉගනුම ලැබේවා
උගතුන් තුන්දෙනා මෙන් වැඳ වැටේවා
රන් තුවරලා මෙන් හොඳ හිත පැදේවා
අරුතක් නොමැති නත්තල ඇති නොවේවා!

බේබදු නාටකය කරළියෙ නොවේවා
සහජීවනය කළඑළියේ පෙනේවා
හිස් ගති බබළනා ගති මතු නොවේවා
නත්තල් බැලුන් මෙන් මිනිසුන් නොවේවා!

හදවත නමැති විමනේ දොර ඇරේවා
කිතු සමිඳුන්ට එහි ඉඩකඩ ලැබේවා
නව දිවියකට නව අදිටන් ගැනේවා
මේ නත්තලට ආසිරි වැසි වසීවා!

සමගිය සමග සොම්නස කඳ බැඳේවා
අතිනත ගෙන වෙසෙන්නට සිත සැදේවා
බෙදෙනා වැට නියර පවුරද බිඳේවා
නව යුගයකට නත්තල මුල පිරේවා!

හැම හැම හිතම යහපතටම හැරේවා
දහමට නතුව හැම මොහොතම ගෙවේවා
සාමයෙ දූතයෙකු වී පිය නැගේවා
වසරේ හැම දිනම නත්තල දිලේවා!

♦ **පූජ්‍ය මොල්ලිගොඩ**
**මෝසස් පෙරේරා පියතුමා**
Sri Lanka

### Forgive Yourself

Things lie deep within ourselves
Fragments buried from the past
You have tried to lay them down
Wish you could forget, at last

Long to go back to those days
So that you could put things right
Sadly that's impossible
You are landed with this blight.

May be God can help you out
But yourself you must forgive
You were different back then
Jesus died to make you live

He has wiped the blackboard clean
So that you can do the same
Draw a line and walk away
Leave the weight of guilt and blame.

♦ **Mike Bullock**
Washington, DC, USA

## නත්තල් ආසිරි !

බෙත්ලෙහෙම් පුරවරේ ගවලෙනේ පෙර දාක
පහන් තරුවක් ගගන පායලා තිබූ රැක
උසුලමින් මහ පොළව සේ පැතුම් රැස නේක
සාමයේ කුමරුවන් ලොවට බිහි කළ සේක

විසල් ඒ පුරවරේ තිබූ නමුත් ප්‍රාසා ද
ඔබට අත දිගු කළේ පුංචි ගවලෙන නේද
ලද දෙයින් සතුටු වන දහම කළ දායා ද
මව්නි ඔබ වැනි කතුන් යළිත් ලොව උපදී ද

පැමිණි දුක් පැණි රසයි හිත හදාගෙන ඉන්න
දුකේදී සැපේදී සිතින් තැන්පත් වන්න
ජය පරාජය තුළින් තවත් පෙරටම යන්න
මරිය මව්තුමියනී අපට ආසිරි දෙන්න!

♦ **ශීලා බාලසූරිය**
බිබිලාදෙණිය Sri Lanka

## ප්‍රාර්ථනා !

පිනි අතරින් ලා හිරු රැස් නැගෙන සඳ
සිව් නෙත් හමුවුණා මල් සරසවිය මැද
හිරුට සිනාසෙන තුරුලිය පුෂ්ප ලෙද
අප හදවත් පිපුණි සෙනෙහස් හිරුට බැඳ

ලෝකෙන් උතුම් පදවිය මට ලැබුණු දිනේ
හදවත් උයනෙ සෙනෙහස් මල් මල් පිපුණේ
ඔබ සිත් පාමුලෙහි ඒ මල් අතුරමිනේ
පිදුවා ඔබට පියරජතුමෙකුන් ලෙසිනේ

ජීවිත ගඟ ගලයි හැල හැප්පිලි මැද්දේ
ලෝ දහමද එයයි අප එය රස වින්දේ
කිසියම් දිනෙක පණ නල මියැදෙන මැද්දේ
පතමු හැම ආත්මෙක හමුවෙමු සබඳේ!

♦ **ප්‍රදීපා වික්‍රමසිංහ** London SW19



## හඬ බිඳුණු හම

ධාරි ධීන් තක ගුඳ ගත ගධිගන
ධගින ධගින නක කත්ත ධගින ගින

ගෙරිහම බැඳගෙන බෙරගෙඩි ඉණ බැඳ
තලන තලන කල හඬන පදම ගෙන
අයෙක් දෙපා තබතෙයි.... ගුඳ ගුඳ කිට
කෙනෙක් පිණුම් ගසතෙයි.... තරිකිට ධින
තවත් අයෙක් ගයතෙයි.... සරිගම පධ
අයෙක් බලා සිටිතෙයි..... සිරි විඳ විඳ

ගෙරිහම තලනා තාලෙට එක්වන
බටලීයක් හඬනා එ විලාසය
රවිකිඤ්ඤදය නගනා කෙඳිරිලි හඬ
සිතාරයෙන් බිඳෙනා මැසිවිලි තත
ඒ සියල්ල යටකරමින් නැගෙනා
දෝංකාරයයි මරණ භයේ
එදා මෙන් අදත් මට ඇසුණේ
අසද් රඟමඬලේ......!

♦ **මාලපල්ලේ**
**කුමුදු රොහාන් අමරසිංහ**
Edmonton London UK

## ජපානයේ බොජුන් හලක දී

ඔබ යුවතියක් විදුලිය මෙන් පැන දුවන
රන් දුන්නක් වගේ මේසය මත නැමෙන
ආහර ඔබ ගෙනෙන ඔබ දෑතින් බෙදන
ඔබ මෙන් රසවත්ය රස නහර පිනවන

ඔබ වෘත්තියෙන් නිළියක බව මා ද දනී
හිනැහෙන දෑස හින්දා මහද නැල විණී
අතරින් පතර එන හෝටලයට රමණී
ඔබ රූ සිරින් මුළු පරිසරය පිබි දිණී

කිමෝනාව ඇඳගෙන ඔබ මෙහි එන්නේ
මල් හිනාව මා මෝහන කර මින්නේ
කන්පෙති යුවළ රන්තරු මෙනි බබ ළන්නේ
කවුරුද කුමරියනි ඒ තරු දෙක දුන්නේ

මගෙ හද ඇදෙයි කීකරු නොවී ඔබ වෙත
මට තේරෙන්නෙ නැහැ ඇයිදැයි මේ විපත
හෝටලයට එන ඔබ වැනිය සිරි කත
ඔබගෙන් ගන්න බැහැ ඉවතට මගේ සිත

සාකේ බඳුන පිළිගන්වන්නට එන්නේ
එය ළඟ තබන විට මගෙ සිත පුබු දින්නේ
ඔබගේ හුස්ම මගෙ සීතල අත වැදුණේ
ඉන් පසු ලැබෙන උණුසුම වෙත දැයි නොදැනේ

මම එන්නෙමි හෙටත් ඔබ දැක ගැනී මට
නොවරදවාම එනු මැන හරියට පහට
ඔබ නාවොතින් සැපතක් නැහැ මගෙ සිතට
සිරුර මලානික වී වැටෙයි හිම පිට

♦ **අභාවප්‍රාප්ත මහාචාර්‍ය්‍ය**
**නන්දසේන රත්නපාල (2007 දී)**

## සාමයේ උදානය

ඇත අහසේ දිලුණ ඉරබටු
තරුව කී ඒ රහස ඇහු ණද
සීත ගන රෑ ගවලෙනක රැදි
සීනු හඬ මොනවත් ඇහෙව් වද
බෙත්ලෙහෙම් පුර පුරා නැංවුණ
ගීත නාදෙන් කිති කවයි හද
කවුරු ඇවිදින් ජේසු කුමරුන්
ලොවට බිහිවූ තතු ඇහෙව් වද

වැටුණු හිම මත නැගුණු සඳරැස්
රිදී පාටක හැංගි ලා
හීන දකිමින් නිදන ගව
පැටියෙකුගෙ නෙත්යුග එළි කළා
පිදුරු මඩුවක රැඳුණු ඔරුවක
පිදුරු රැල්ලක වැති රිලා
මරියතුමියනි ඔබෙන් සාමයෙ
පහන් රැළ ලොව යයි ගලා

නැහැය පිනවන මදු සුවඳ දෙන
රහස සුවඳැති මල් වලයි
දුහඳ දියතට විදා ලන්නෙද
පිපුණු කීඩාරම් මලයි
වෛරයෙද සාමයෙද උල්පත
මිනිස් හදවත් ගැබ තුළයි
සදා නත්තල විදා ලන්නේ
සාමයෙන් පිරි සිත් වලයි

♦ **ජයන්ත නිමලසිරි**
කුඩා වස්කඩුව Sri Lanka

## දාරක ප්‍රේමය

සෙනෙහසේ මල් සිත් හි දරා
දාරක ප්‍රේමයේ කිරුළ පළඳලා
නෙක සව්සිරියෙන්
පිරුණු ලෝකයේ දොරගුළු හැරදා
සිහිති දෝණියේ !
දුනිමි මා නුඹට උපත.

බලා සිටියෙමි දෙනෙත් දල්වා
වැඩෙන තුරු නුඹ

සිනාසුනෙමි හදවතින්
පිබිදෙන මල් කැකුළ දැක
දැරුවෙමි හැම විඩා
හදේ සෙනෙහස වඩා
දියකළා කඳුළු හා ඩහදිය
සිනාසෙන්නට නුඹ හා එක්වී
මතු දිනේ!
වියපත් තටු ලබා
අනන්තය සොයා දෝ
ගියා නුඹ ඉගිලිලා
නතර නොවී මා හා
නැණ නුවණ මිණිබරණ
සොයා සක්වල සරා

ගිලිහුනත් සියළු දෑ
නුඹ මනස් කවුළුවෙන්
යන්න ! පෙරටම දුවේ
අවැසි සේ ලබාගන්නට
තබාපන් සුළු ඉඩක් මටත්....
මමත් කළ යුතු යමක් ඇත්නම්
තවත්.....

♦ **මොරින් සී පෙරේරා**
London



## බිම්මල්

මුදල් ගස් යට පිපේ නිරතුරු
මිනිස්කම රැදි නිහඬ බිම්මල්
වැඩෙන්නට කිසි ඉඩක් නොලබා
පොහොර වී යයි ලොවට නොපෙනී

පැමිණ අදමිටු වේශයෙන්
හමන මඳ නල සලයි අතු ඉති
සැලෙයි කොළම්ටි වසා බිම්මල්
යහ ගුණය පොළවටම තෙරපා

සුවඳ නැත නෙක පාට පෙති නැත
බමරු අද්දන මධු විතක් නැත
නෙලාගන්නට උවමනා නැත
මල් බඳුන්වල තිබෙනු දැක නැත!

♦ **සුනිල් පෙරේරා**
Skegness Lincs UK